(10 ශ්‍රේණියේ තෙවන වාරයේ කාලච්ඡේද 18 ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 10 ශ්‍රේණිය තෙවන වාරය සඳහා තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම් | | | | | | |
| 7.0 ජීව අජීව පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 10.7.1 බුදුරජාණන් වහන්සේ ජීව අජීව පරිසරයට හිතකාමී ව ගත කළ අයුරු දැන පරිසර සංවේදී ජීවිතයක් ගත කිරීමට ක්‍රියා කරයි | • බුදු සිරිත හා සම්බන්ධ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා ගෙනහැර දක්වයි.<br>• ජීවී පැවැත්මට ස්වාභාවික පරිසරයෙන් ලැබෙන දායකත්වය අගය කරයි.<br>• තම පරිසරය ප්‍රසන්නව පවත්වා ගනියි.<br>• පරිසරය සංරක්ෂණයෙහි යෙදෙයි. | බුදු සිරිතේ ස්වාභාවික පරිසරය හා බැඳුණු අවස්ථා | | 16 බුදු සිරිතයි පරිසරයයි | 03 |
| 7.0 ජීව අජීව පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | 10.7.2 නිරෝගීතාවට අදාළ බෞද්ධ ඉගැන්වීම් ඉගෙන සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරයි | • බුදුරජාණන් වහන්සේ අනුදත් දින චර්යාව පැහැදිලි කරයි.<br>• බුදුරජාණන් වහන්සේ දින චර්යාවෙන් ආදර්ශ ලබා ගත හැකි බව පිළිගනියි.<br>• අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට කාල සටහනක් සකස් කරයි.<br>• කාල කළමනාකරණයෙන් යුතුව කටයුතු කරයි<br>• විවේකය ඵලදායිව ගත කරයි | විනය පිටකයේ අදාළ ඉගැන්වීම් | | 17 නිරෝගී බව උතුම්ම ලාභයයි | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 10.8.1 ශාසන පැවැත්ම උදෙසා ධර්ම සංගායනාවලින් වූ සේවය හැඳින, ශාසන සුරක්ෂිතතාවට දායක වෙය | • අලුවිහාර ධර්ම සංගායනාව හා කනිෂ්ක ධර්ම සංගායනාවේ වැදගත්කම විස්තර කරයි.<br>• සංගායනා ශාසන චිරස්ථිතියට හේතු වූ බව පිළිගනියි.<br>• අලුවිහාර හා කනිෂ්ක යන සංගායනා දෙකෙහි ප්‍රතිඵල ලැයිස්තු ගත කරයි. | ථෙරවාද ධර්ම සංගායනා පිළිවෙළේ සතර වැන්න මාතලේ අලුවිහාර සංගායනාව, ඉන්දීය ඉතිහාසයේ ධර්ම සංගායනා පිළිවෙළෙහි සතර වැන්න කණිෂ්ක සංගායනාව | | 19 සසුන සුරැකි සංගායනා | 03 |
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | 10.8.2 ශාසන ඉතිහාසයෙන් උරුම වූ ගෘහ නිර්මාණ ශිල්ප, චිත්‍ර හා කැටයම් අගයමින් ඒවා සංරක්ෂණය කිරීමට දායක වෙයි. | • ශාසන ඉතිහාසයෙන් අපට උරුම වූ කලා නිර්මාණ මොනවාදැයි පැහැදිලි කරයි.<br>• කලා ශිල්ප සංරක්ෂණය කළ යුතු බව පෙන්වා දෙයි.<br>• ගෘහ නිර්මාණ, චිත්‍ර කැටයම්වලට අදාළ නිර්මාණ වෙන් වෙන් ව ලැයිස්තු ගත කරයි.<br>• අතීත උරුමයන් අගයමින් ආරක්ෂා කරයි.<br>• පෞරාණික ස්ථාන නැරඹීමේ දී ඒවායේ පෞරාණිකත්වයට හානි නොවන සේ කටයුතු කරයි. | ස්තූපය, ස්තූප වර්ග, ස්තූපයක කොටස්, චෛතියඝර, වාහල්කඩ, පියගැට පෙළ මුරගල, කොරවක්ගල, සඳකඩ පහණ, බෝධිඝර අනුරාධපුර, පොළොන්නරු චිත්‍ර | | 20 හෙළ කලාවන් සුරකිමු. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ගුරු මාර්ගෝපදේශයේ ක්‍රියාකාරකම් අංකය | පෙළ පොතේ පාඩමේ අංකය සහ නම | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳිනගෙන ඒ අනුව ක්‍රියාකරයි. | 10.9.1 බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති හඳාරා තම ජීවිතයේ නායකත්ව අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දෙයි. | • රාජ්‍ය පාලනයට උපයෝගි කරගත හැකි බෞද්ධ ප්‍රතිපත්ති විස්තර කරයි.<br>• ධාර්මිකත්වය පදනම් කොට බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති සකස් වී ඇති බව පිළිගනියි.<br>• වගකීමෙන් හා වගවීමෙන් යුතු ව කටයුතු කරයි.<br>• නීති ගරුක ව ජීවත් වේ. | දස සක්විතිවත්, සප්ත අපරිහානීය ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති විරතිය ප්‍රායෝගික ජීවිතයට සම්බන්ධ කිරීම | | 22 රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | 03 |
| 10.0 නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | 10.10.1 ශ්‍රද්ධාව පෙරටු කොට ආර්ය මාර්ගයේ ගමන් කිරීමට රාග, ද්වේශ, මෝහ පාලනය කළ යුතු බව පිළිගෙන ක්‍රියා කරයි | ▪ ආර්ය මාර්ගයේ ගමන් කිරීම සඳහා ශ්‍රද්ධාව මුල් වන ආකාරය පැහැදිලි කරයි.<br>▪ රාග, ද්වේශ, මෝහ පාලනය කිරීමෙන් සැනසිලිදායක ජීවිතයක් ගත කළ හැකි බව පිළිගනියි.<br>▪ අනිසි ලෙස පසිඳුරන් පිනවීමේ ආදීනව මැයෙන් කථාවක් පවත්වයි.<br>▪ ගැටුම් ඇති වීමට හේතු නිරන්තරයෙන් සොයා බලයි.<br>▪ සහනශීලී ජීවිතයක් ගත කරයි | ශ්‍රද්ධාව රාගක්ඛය, දෝසක්ඛය, මෝහක්ඛය | | 23 ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි | 03 |
| එකතුව | | | | | | **18** |